


**මෙම සමාගමේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පි (වායු සමීකරණ) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සියළුම වායු සමීකරණ යන්ත්‍ර හා පද්ධති වල නඩත්තු කටයුතු, අළුත් වැඩියාවන් හා සවිකිරීම් අධීක්ෂණ නිළධාරීන් යටතේ සිදු කිරීම.

**රැකියාවේ වගකීම :**

i. සියළුම චිලර් වර්ග හා එයට අදාළ අනෙකුත් වායුසමීකරණ පද්ධති උපකරණවල අළුත්වැඩියා, පූර්ණ අළුත්වැඩියාද ඇතුළුව සිදු කිරීම.

ii. වායුසමීකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති වල (විදුලි පාලක උපකරණ ඇතුළුව) පෙර ලැයිස්තු ගත සේවා සහ පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් හා අධීක්ෂණ යටතේ පවත්වාගෙන යාම හා පවත්නා විශේෂිත තත්ත්වයන් පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

iii. ඉහත සඳහන් පද්ධති වල හදිසි බිඳවැටීම් (විදුලි පාලක උපකරණ ඇතුළුව) සඳහා ක්ෂණිකව සහභාගි වී ඒවා නිවැරදි කිරීම හා ඒ සම්බන්ධ අදාල අංශ සමග මනා සන්නිවේදනයකින් හා සහයෝගයෙන් කටයුතු කිරීම.

iv. වායු සමීකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති, වායුසමන ජල පොම්ප, වායුසමන ජලනල සහ උපකරණ නිසි අවධානයකින් හා අධීක්ෂණයකින් මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වාගෙන යාම හා එයට අදාළ අමතර කොටස් හා යෙදවුම් පෙර ලැයිස්තු ගත කල යුතුවේ.

v. ඉහත පද්ධති පෙර ලැයිස්තු ගත පරීක්ෂා කිරීම් කළ යුතු අතර, අදාළ වාර්ථා නිසි ලෙස පවත්වා ගෙන යාම.

vi. අදාළ පද්ධතිවල දත්ත හා විශ්ලේෂණයන් ලබා ගැනීමට සහ වාර්තාගත කිරීම් සිදු කිරීම සඳහා සහාය වීම.

vii. අනෙකුත් වායු සමීකරණ කාර්මිකයන්ගේ කටයුතු සඳහා ද අවශ්‍ය අවස්ථාවන් වලදී සහාය දැක්විය යුතු අතර අධීක්ෂණ නිලධාරීන් විසින් කලින කලට පවරනු ලබන අනෙකුත් සේවා කටයුතු ඉටු කිරීම.

viii. හදිසි ආපදාකාරී අවස්ථාවන්වලදී ගුවන් තොටුපොල නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

ix. ඉහත සියළුම පද්ධතීන් පූර්ව නිරීක්ෂණය කර දෝෂ හඳුනා ගැනීම හා වාර්ථා කිරීම.

**සුදුසුකම්** : (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් /ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වායු සමීකරණ ක්ෂේත්‍රයේ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය සහතිකයක් වායු සමීකරණ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) සහතිකයක් වායු සමීකරණ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාල සීමාවද/ පාඨමාලා කාලසීමාව/ පුහුණු කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පලපුරුද්දක් අදාල ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප** : තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂනීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** : ප්‍රායොගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් **“සභාපති, ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක”** යන ලිපිනයට **2025 මාර්තු මස 04 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (වායු සමීකරණ) II වන ශ්‍රේණිය තනතුර** ලෙස සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන් හට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාල සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 23/02/2025**